SRI LANKA

**ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය**

## අදියර III විභාගය - 2026 ජනවාරි

## යෝජිත උත්තර

# (304) සංස්ථාපිත සහ පුද්ගලික බදුකරණය (CPT)


**ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය**
නො. 540 , පූජ්‍ය මුරුත්තෙට්ටුවේ ආනන්ද නාහිමි මාවත,
නාරාහේන්පිට, කොළඹ 05.
දුරකථන : 011-2-559 669



**මෙය අධ්‍යාපන හා පුහුණු කිරීම් අංශයේ ප්‍රකාශනයකි**

**ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය**

**අදියර III විභාගය - 2025 ජනවාරි**

**(304) සංස්ථාපිත සහ පුද්ගලික බදුකරණය**

**යෝජිත උත්තර**

**(මුළු ලකුණු 20)** **A කොටස**

## *පළමුවන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර :*

**පරිච්ඡේදය 01: ශ්‍රී ලංකාවේ බදුකරණය හැඳින්වීම**

**(a)** 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 69 (4) වගන්තියට අනුව, යම් සමාගමක්;

- ශ්‍රී ලංකාවේ නීතිය යටතේ සංස්ථාගත කර හෝ පිහිටුවා ඇත්නම්;
- එය ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කර ඇත්නම් හෝ එහි ප්‍රධාන කාර්යාලය ශ්‍රී ලංකාවේ පිහිටුවා ඇත්නම්; හෝ
- තක්සේරු වර්ෂයේ යම් අවස්ථාවකදී එම සමාගමේ කටයුතු කළමනාකරණය සහ පාලනය ශ්‍රී ලංකාව තුල ක්‍රියාත්මක කර ඇත්නම්,

එම සමාගම එම තක්සේරු වර්ෂය සඳහා ශ්‍රී ලංකාවේ වාසිකයෙකු වන්නේය.

සීමාසහිත ක්‍රිසුදු (පෞද්ගලික) සමාගම ශ්‍රී ලංකාවේ නීතිය යටතේ සංස්ථාගත කර ඇති බැවින් එය **ශ්‍රී ලංකාවේ වාසික සමාගමක් වන්නේය.** ශ්‍රී ලංකා ආදායම් බදු පනත යටතේ, ඉහත නිර්ණායක කිසිවක් සපුරා ඇත්නම් සමාගමක් වාසික සමාගමකි. එබැවින්, සීමාසහිත ක්‍රිසුදු (පෞද්ගලික) සමාගමේ ලෝක ව්‍යාප්ත ආදායම මත ශ්‍රී ලංකාව තුළ බදු අය කෙරේ.

***(ලකුණු 03)***

**(b)**

- එකතු කළ අගය මත බද්ද
- සුරාබදු බද්ද
- රේගු බද්ද
- සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද
- මුද්දර බද්ද
- සෙස් බද්ද
- විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද
- වරාය සහ ගුවන්තොටුපළ සංවර්ධන බද්ද

***(ලකුණු 02)***
***(මුළු ලකුණු 05)***



aat SRI LANKA

## දෙවන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර :

**පරිච්ඡේදය 06: රඳවා ගැනීමේ බදු සහ ප්‍රාග්ධන ලාභ බද්ද සහ බදුකරණයට අදාළ නඩු තීන්දු**

| | වාසික නිවස | රබර් වත්ත | හිස් ඉඩම |
|---|---|---|---|
| ලැබුණු ප්‍රතිෂ්ඨාව | 13,500,000 | ආයෝජන වත්කමක් නොවේ | 16,470,000 |
| (-) ඉඩමේ පිරිවැය | | | |
| 2017.09.30 වන දිනට හෝ අත්පත් කරගත් දිනට වෙළෙඳපොළ අගය | (10,000,000) | | (11,850,000) |
| තැරව් ගාස්තු | (1,350,000) | | (1,947,000) |
| **ප්‍රාග්ධන ලාභ** | **2,150,000** | | **2,673,000** |

| | | |
|---|---|---|
| 2010 සිට භාවිතා කරන ලද වාසික නිවස (උරුමයෙන් ලැබුණු) | බද්දෙන් නිදහස් | පහත සඳහන් කොන්දේසි දෙකම සපුරා ඇත්නම්, පුද්ගලයෙකුගේ මූලික වාසික ස්ථානය උපලබ්ධි වීමෙන් ලැබෙන ප්‍රාග්ධන ලාභය, ප්‍රාග්ධන ලාභ බද්දෙන් නිදහස් වේ:<br>1. උපලබ්ධි වීමට පෙර අවම වශයෙන් වසර 3 ක් වත් දේපළ අඛණ්ඩව හිමිකාරීත්වය දරමින් තිබිය යුතුය.<br>2. දෛනික පදනමින් ගණනය කරන ලද එම වසර 3 න් අවම වශයෙන් වසර 2 ක් වත් පුද්ගලයා එම දේපළෙහි ජීවත් වී තිබිය යුතුය. |
| රබර් වත්ත (රබර් වලින් ආදායම් උපයන ලද) | | ආයෝජන වත්කමක් නොවේ<br>(රබර් වලින් ආදායම් උපයන ලද රබර් වත්ත ආයෝජන වත්කමක් නොවේ. එබැවින් ප්‍රාග්ධන ලාභ බද්දට යටත් නොවේ.) |

මාතලේ පිහිටි හිස් ඉඩම (2014 දී මිලට ගත්) = රු.2,673,000 X 10% = රු.267,300

***(මුළු ලකුණු 05)***

## තෙවන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර :

**පරිච්ඡේදය 06: රඳවා ගැනීමේ බදු සහ ප්‍රාග්ධන ලාභ බද්ද සහ බදුකරණයට අදාළ නඩු තීන්දු**

x සහ සමාගම යනු අර්ජුන් සහ ප්‍රියාල් අතර ලාභා'ලාභ සම සමව බෙදා ගන්නා හවුල්කාරිත්වයකි (එක් එක් හවුල්කරු සඳහා 50% බැගින්). අර්ජුන්, සමීර සමඟ වෙනම උප-හවුල් ව්‍යාපාර ගිවිසුමකට එළඹ ඇති අතර, ඒ යටතේ අර්ජුන්ගේ ලාභයෙන් 25% ක් ලැබීමට සමීර හිමිකම් ලබයි. මෙම ගිවිසුම ප්‍රියාල්ගේ කොටසට බලපෑමක් නොකරයි.

මෙම එකඟවීමේ ආදායම් බදු බලපෑම ඒ.ඒ.ඩාවුඩ්බෝයි එදිරිව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් (A.A.Davoodbhoy Vs CGIR) නඩු තීන්දුව පදනම් කරගනිමින් පැහැදිලි කළ හැකිය.

මෙම නඩුවේදී අධිකරණය සලකා බැලූ ප්‍රධාන කරුණ නම් උප-හවුල්කාරිත්ව ගිවිසුමක් යටතේ

ලාභය බෙදා ගැනීමේදී මුල් හවුල්කරුවන්ගේ බද්දට යටත් ආදායම අඩු කළ හැකිද යන්නයි. අධිකරණය පැවසුවේ එක් හවුල් ව්‍යාපාරක ලාභය බෙදා ගැනීමට තවත් හවුල් ව්‍යාපාර ඇති කර ගැනීම නීතියෙන් වලංගු වන බවයි. නමුත් හවුල් ව්‍යාපාරයකින් ලැබෙන ආදායම මුලින්ම නීතියෙන් එම ලාභයට හිමිකම් ඇති හවුල්කරුගේ අතේම බද්දට යටත් කර ඇස්තමේන්තු කළ යුතු බව අධිකරණය තීරණය කළේය. එනම් පෞද්ගලික ගිවිසුමක් මඟින් එම ආදායම වෙනත් අයෙකු සමඟ බෙදා ගැනීම "ආදායම උත්පන්න වන අවස්ථාවේම වෙනස් වීමක්" ලෙස සැලකෙන්නේ නැත. ඒ වෙනුවට එය සැලකෙන්නේ ආදායම ඔහුට ලැබුණු පසු එය භාවිතා කිරීමක් හෝ බෙදා හැරීමක් ලෙසයි.

මෙහි ඉදිරිපත් කර ඇති අවස්ථාවේදී, ප්‍රධාන හවුල් ව්‍යාපාර ගිවිසුම යටතේ x සහ සමාගමෙහි ලාභයෙන් 50% ක ප්‍රමාණයක් අනුව මුලින්ම අර්ජුන්ට හිමිවේ. අර්ජුන් සහ සමීර අතර ඇති උප හවුල් ව්‍යාපාර ගිවිසුම පෞද්ගලික එකඟතාවක් පමණක් වන අතර, සමීර x සහ සමාගමෙහි හවුල්කරුවෙක් නොවේ. එබැවින්, එම ආදායම නීතිමය වශයෙන් මුලින්ම අර්ජුන්ට අයත් වේ. ඔහුගේ 50% හිමිකම් ලාභයෙන් 25% ක් සමීරට ගෙවීම, ආදායම ලැබීමෙන් පසු කරන ආදායම භාවිතා කිරීමක් පමණි. **ඒ අනුව, අර්ජුන්ට හවුල්කාරීත්ව ලාභයෙන් ඔහුගේ සම්පූර්ණ 50% කොටස මත බදු අය කළ හැකි අතර සමීරට ගෙවූ 25% කොටස බදු ගණනය කිරීමේදී අඩු කළ හැකි වියදමක් ලෙස පිළිගැනෙන්නේ නැත. සමීර, උප හවුල්** ව්‍යාපාරයෙන් **ලද ආදායම මත වෙනම බද්දට යටත් වන අතර ප්‍රියාල්, x සහ සමාගමෙහි ලාභයෙන් ඇයට හිමි 50% කොටස මත බද්දට යටත් වේ.** මේ අනුව, ඒ.ඒ.ඩාවුඩ්බෝයි එදිරිව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් නඩු තීන්දුවේ ස්ථාපිත මූලධර්මය අනුගමනය කරමින්, උප-හවුල් ව්‍යාපාර ගිවිසුමක් මඟින් අර්ජුන්ගේ බද්දට යටත් ආදායම අඩු නොවේ.

*(ලකුණු 05)*

## *හතරවන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර :*

| **පරිච්ඡේදය 07: වෙනත් බදු** |
|---|

**(a)**

| **සීමාසහිත මිලේනියම් හොටෙල්ස් (පෞද්ගලික) සමාගම** | |
|---|---|
| **ගෙවිය යුතු සංචාරක සංවර්ධන බද්ද** | |
| **2025 මාර්තු 31 දිනෙන් අවසන් වන කාර්තුව සඳහා** | |
| | **(රු.)** |
| කාමර වලින් ලද ආදායම | 1,650,000 |
| ආහාරපාන වලින් ලද ආදායම | 2,758,000 |
| සම්භාහන මධ්‍යස්ථානයෙන් ලද ආදායම | 876,500 |
| **මුළු ආදායම (සේවා ආදායම හැර)** | **5,284,500** |
| | |
| **සංචාරක සංවර්ධන බද්ද (10% බදු අනුපාතය යටතේ)** | **52,845** |

*(ලකුණු 03)*

**(b)**

| | |
|---|---|
| විකුණන ලද කොටස් ගණන | = 10,000 |
| කොටසකට විකුණුම් මිල | = රු. 35/- |
| ගනුදෙනුවේ වටිනාකම | = රු. 350,000 |

XYZ සමාගම විසින් ගෙවිය යුතු කොටස් ගනුදෙනු බද්ද,

350,000×0.3%=350,000×0.003 = රු. 1,050/-

***(ලකුණු 02)***
***(මුළු ලකුණු 05)***

***A කොටසෙහි අවසානය***

(මුළු ලකුණු 30)

**B කොටස**

## පස්වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර :

**පරිච්ඡේදය 07: වෙනත් බදු**

| | | | |
|---|---|---|---|
| **සීමාසහිත DGB (පෞද්ගලික) සමාගම** | | | |
| **එකතු කළ අගය මත බදු වගකීම ගණනය කිරීම** | | | |
| 2025 මාර්තු 31 දිනෙන් අවසන් වන කාර්තුව සඳහා | | | |
| **නිමැවුම් බද්ද** | **සැපයුම් වටිනාකම** | **බදු අනුපාත %** | **එකතු කළ අගය මත බද්ද** |
| දේශීය විකුණුම් | 36,672,000 | 18% | 6,600,960 |
| අපනයන විකුණුම් | 5,254,000 | 0% | - |
| ලද කුලී ආදායම | 225,000 | 18% | 40,500 |
| මෝටර් ලොරි රථයක් ඉවත් කිරීම | 3,540,000 | 18% | 637,200 |
| **මුළු නිමැවුම් බද්ද** | | | **7,278,660** |
| | | | |
| **යෙදවුම් බද්ද** | | | |
| අමුද්‍රව්‍ය ආනයනය කිරීම මත | | 2,423,000 | |
| දේශීය මිලදී ගැනීම් මත | | 1,473,000 | |
| අධ්‍යක්ෂකවරයෙකු විසින් භාවිතා කළ මෝටර් කාර් රථයකට සිදුකළ අලුත්වැඩියා මත | | ඉඩ නොදේ | |
| හිමිකම් කිව හැකි යෙදවුම් බද්ද | | **3,896,000** | |
| ඉදිරියට ගෙන එන ලද අවශෝෂණය නොකළ යෙදවුම් බද්ද | | 524,520 | |
| **මුළු හිමිකම් කිව හැකි යෙදවුම් බද්ද** | | | **(4,420,520)** |
| **ගෙවිය යුතු එකතු කළ අගය මත බද්ද** | | | **2,858,140** |
| **අඩු කළා:** | | | |
| මාසික වාරික ගෙවීම් | | | (1,500,000) |
| **ගෙවිය යුතු ඉතිරි එකතු කළ අගය මත බද්ද** | | | **1,358,140** |

*(ලකුණු 10)*

## හයවන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර :

**පරිච්ඡේදය 04: විවිධ ව්‍යාපාර සඳහා බදුකරණය**

| **Event Planners** හවුල් ව්‍යාපාරය | | | |
|---|---|---|---|
| **2024/25 තක්සේරු වර්ෂය සඳහා ආදායම් බදු වගකීම ගණනය කිරීම (රු.)** | | | |
| | **සටහන්** | **(+)** | **(-)** |
| බදු පෙර ශුද්ධ ලාභය | | 16,450,000 | |
| ස්ථාවර තැන්පතු මත ලැබුණු පොලිය | | | 250,000 |
| **හවුල්කරුවන්ට ගෙවූ වැටුප් - ඉඩ නොදේ** | | | |
| - රුවන් | | 2,400,000 | |
| - මධූ | | 3,600,000 | |
| බෙදාහැරීමේ වාහන සඳහා කුලිය | | ඉඩ දේ | |
| මධුගේ පුත්‍රයාගේ වැටුපඃ කළමනාකරුවෙකු ලෙස සේවය කිරීම වෙනුවෙන් | | ඉඩ දේ | |
| පරිත්‍යාග | | 300,000 | |
| ගිණුම්කරණ ක්ෂය | | 100,000 | |
| ප්‍රාග්ධන දීමනාව | | | 200,000 |
| | | **22,850,000** | **450,000** |
| **හවුල් ව්‍යාපාර ආදායම** | | **22,400,000** | |
| එකතු කළාඃ ආයෝජන ආදායම | | | |
| ස්ථාවර තැන්පතු මත ලැබුණු පොලිය (දළ) | | 250,000 | |
| **හවුල් ව්‍යාපාරයේ තක්සේරු කළ හැකි ආදායම** | | **22,650,000** | |
| **අඩු කළාඃ 52 වගන්තිය සුදුසුකම් ලබන ගෙවීම් සහ සහන** | | | |
| රජයේ රෝහලකට කරන ලද පරිත්‍යාගය | | (300,000) | |
| **හවුල් ව්‍යාපාරයේ බදු අය කළ හැකි ආදායම** | | **22,350,000** | |
| **හවුල් ව්‍යාපාරයේ ගෙවිය යුතු බදු වගකීම ගණනය කිරීම** | | | |
| පළමු 1,000,000 @ 0% | | | - |
| ශේෂය මත 21,350,000 @ 6% | | | 1,281,000 |
| **ගෙවිය යුතු දළ බද්ද** | | | **1,281,000** |

*(මුළු ලකුණු 10)*

## හත්වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර :

**පරිච්ඡේදය 05: බැඳීම් සහ ක්‍රියාපටිපාටි**

**(A)**

**(a)** 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 93 වන වගන්තියට අනුව, ආදායම් බදු අය කළ හැකි සෑම පුද්ගලයෙකුම තක්සේරු වර්ෂය අවසන් වීමෙන් පසු නොවැම්බර් 30 වන දින හෝ ඊට පෙර ආදායම් වාර්තාවක් ගොනු කළ යුතුය. එබැවින්, තක්සේරු වර්ෂය සඳහා වාර්තාව 2025 නොවැම්බර් 30 වන දින හෝ ඊට පෙර ඉදිරිපත් කළ යුතුය. *(ලකුණු 02)*

**(b)**

- ඉදිරිපත් කිරීමට අපොහොසත් වීම දිගින් දිගටම පවතින සෑම මාසයකටම හෝ මාසයක කොටසකටම ගෙවිය යුතු බදු මුදලින් 5%ක් සහ ගෙවිය යුතු බද්දෙන් තවත් 1%ක්; සහ
- ඉදිරිපත් කිරීමට අපොහොසත් වීම දිගින් දිගටම පවතින සෑම මාසයකටම හෝ මාසයක කොටසකටම රු. 50,000ක් සහ තවත් රු. 10,000ක්.

යන දෙකෙන් වැඩි ප්‍රමාණය;

කෙසේ වෙතත්, දඩ මුදල රු. 400,000/- නොඉක්මවිය යුතුය.

*(ලකුණු 03)*

**(B)**

**(a)**

i. 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 135 (2)(b) වගන්තියේ විධිවිධාන අනුව, මාස තිහක් ඇතුළත, ස්වයං තක්සේරුවක් සඳහා, ස්වයං තක්සේරුවට අදාළ වන ස්වයං තක්සේරු වාර්තාව ගොනු කළ දිනය.

ii. 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 135 (2)(a) වගන්තියේ විධිවිධාන වලට අනුව, වංචාවක් හෝ බරපතල හෝ චේතනික නොසලකා හැරීමක් සිදුකර ඇති ඕනෑම අවස්ථාවක සංශෝධිත/අතිරේක තක්සේරුවක් නිකුත් කළ හැකිය.

*(ලකුණු 03)*

(b)

- තක්සේරු කරන ලද බදු
- තක්සේරු කරන ලද දඩ මුදල
- බදු කාලය
- බදු සහ දඩ මුදල ගෙවීමට නියමිත දිනය
- තක්සේරුවට විරෝධය දක්වන ආකාරය

*(ලකුණු 02)*

*(මුළු ලකුණු 10)*

***B* කොටසෙහි අවසානය**

SRI LANKA

(මුළු ලකුණු 50) **C කොටස**

## අටවන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර :

**පරිච්ඡේදය 03 පුද්ගලයින් සහ සමාගම් සඳහා බදුකරණය**

**සීමාසහිත ක්‍රිස්ටල් බෙවරේජස් සමාගම**
**2024/25 තක්සේරු වර්ෂය සඳහා**
**ආදායම් බදු වගකීම ගණනය කිරීම** (රු. 000)

| | | |
|---|---|---|
| ව්‍යාපාර ආදායම (සටහන 01) | | 13,410 |
| **ආයෝජන ආදායම:** | | |
| පොලී ආදායම - ස්ථාවර තැන්පතු | | 8,950 |
| කුලී ආදායම | | 16,940 |
| **මුළු තක්සේරු කළ හැකි ආදායම** | | 39,300 |
| අඩු කළා: 52 වගන්තිය යටතේ සුදුසුකම් ලත් ගෙවීම් සහ සහන | | - |
| ප්‍රාදේශීය සභාවට කරන ලද භාණ්ඩ පරිත්‍යාගය | | (500) |
| **බදු අය කළ හැකි ආදායම** | | **38,800** |
| 30% ක බදු වගකීම | | 11,640 |
| අඩු කළා: බදු බැර: | | |
| ස්ව තක්සේරු පදනම මත ගෙවූ වාරික | | (6,500) |
| ස්ථාවර තැන්පතු පොලී මත රඳවා ගැනීමේ බදු (8,950,000 X 5%) | | (447.5) |
| කුලිය මත අත්තිකාරම් ආදායම් බද්ද (16,940,000 X 10%) | | (1,694) |
| **ගෙවිය යුතු ඉතිරි ආදායම් බදු** | | **2,998.5** |

**සටහන 01 - ව්‍යාපාර ආදායම ගණනය කිරීම**

| | රු. | රු. |
|---|---|---|
| | + | - |
| බදු පෙර ශුද්ධ ලාභය (අලාභය) | 32,600,000 | |
| **අඩු කළා: ආයෝජන ආදායම්** | | |
| ස්ථාවර තැන්පතු වලින් ලද පොලී ආදායම - ආයෝජන ආදායම - වෙනම බද්දට යටත් වේ. | | 8,950,000 |
| කුලී ආදායම - ආයෝජන ආදායම - වෙනම බද්දට යටත් වේ. | | 16,940,000 |
| **එකතු කිරීම / අඩු කිරීම** | | |
| ගිණුම්කරණ ක්ෂයවීම්: 10 වන වගන්තිය යටතේ ඉඩ දෙනු නොලැබේ | 8,870,000 | |
| පාරිතෝෂික සඳහා වෙන් කිරීම් | 2,500,000 | |
| විනෝදාස්වාදය - සේවාදායකයෙකු පිළිගැනීම - ආදායම් උත්පාදනය සඳහා දරනු ලබන වියදමක් බැවින් ඉඩ දෙනු ලැබේ. | - | |
| විනෝදාස්වාදය - වාර්ෂික චාරිකාව - ආදායම් උත්පාදනය සඳහා දරනු ලබන වියදමක් නොවන බැවින් ඉඩ දෙනු නොලැබේ. | 450,000 | |

| | | |
|---|---|---|
| විදේශ සංචාර - ආදායම් උත්පාදනය සඳහා දරනු ලබන වියදමක් බැවින් ඉඩ දෙනු ලැබේ. | - | |
| වත්කම් ඉවත් කිරීම මත අලාභය | 150,000 | |
| බොල් ණය කපා හැරීම - ඉඩ දෙනු ලැබේ | - | |
| අඩමාන ණය සඳහා වෙන් කිරීම් | 95,000 | |
| වෙළෙඳ ලකුණ ලියාපදිංචි කිරීම - ප්‍රාග්ධන ස්වභාවයේ වියදමකි - ඉඩ දෙනු නොලැබේ | 200,000 | |
| අනෙකුත් නීති සහ වෘත්තීය ගාස්තු - ඉඩ දේ | - | |
| බදු ගෙවීම් ප්‍රමාද කිරීම මත දඩ මුදල් සහ දන්ඩණ - ඉඩ දෙනු නොලැබේ. | 120,000 | |
| පරිත්‍යාග | 500,000 | |
| **ප්‍රාග්ධන දීමනා** | | |
| **වසර තුළ එකතු කිරීම්** | | |
| පිරියත සහ යන්ත්‍ර - අවුරුදු 5 ට වැඩි 4,500,000 | | 900,000 |
| ගොඩනැගිලි - අවුරුදු 5 ට වැඩි 7,000,000 | | 75,000 |
| **පෙර වසරවල** | | |
| ඉඩම - හිමිකම් නැත | | - |
| කාර්යාල ගොඩනැගිල්ල - අවුරුදු 20 ට වැඩි 15,000,000 | | 750,000 |
| පිරියත සහ යන්ත්‍ර - අවුරුදු 5 ට වැඩි 7,000,000 | | 1,400,000 |
| මෝටර් රථ - 18,600,000 - (6,000,000 - 3,200,000) අවුරුදු 5 ට වැඩි | | 1,880,000 |
| කළමනාකාර අධ්‍යක්ෂවරයාගේ මෝටර් රථයඃ ප්‍රාග්ධන දීමනාව සඳහා ඉඩ නොදේ. | | - |
| ගෘහ භාණ්ඩ සහ සවි කිරීම් - අවුරුදු 5 ට වැඩි 2,800,000 | | 560,000 |
| **වත්කම් ඉවත් කිරීම මත තක්සේරු කළ හැකි ගාස්තු / තුලනය කිරීමේ දීමනාව** | | |
| ප්‍රතිෂ්ඨාව 2,850,000 | | |
| අඩු කළාඃ පිරිවැය (3,200,000) | | |
| අඩු කළ ප්‍රාග්ධන දීමනාව : (3,200,000/5X2) 1,280,000 | | |
| බදු සඳහා ලියා හල අගය 1,920,000<br>2,850,000 - 1,280,000 | | |
| වත්කම් ඉවත් කිරීම මත තක්සේරු කළ හැකි ගාස්තු | 930,000 | |
| ගෙවූ පාරිතෝෂික | | 900,000 |
| | 46,415,000 | 32,355,000 |
| **මුළු ව්‍යාපාර ආදායම** | | **14,060,000** |
| අඩු කළාඃ ඉදිරියට ගෙන ආ ව්‍යාපාර අලාභ | | **(650,000)** |
| **ව්‍යාපාර ආදායම** | | **13,410,000** |

*(මුළු ලකුණු 25)*



aat SRI LANKA

*නවවන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර :*

**පරිච්ඡේදය 03 පුද්ගලයින් සහ සමාගම් සඳහා බදුකරණය**

**මෙවන් මහතා**
**2024/25 තක්සේරු වර්ෂය සඳහා**
**ආදායම් බදු වගකීම ගණනය කිරීම** (රු.)

| | | |
|---|---|---|
| සේවා නියුක්ත ආදායම | සටහන 1 | 8,700,000 |
| ව්‍යාපාර ආදායම | සටහන 2 | 3,930,000 |
| ආයෝජන ආදායම | සටහන 3 | 2,700,000 |
| **මුලු තක්සේරු කළ හැකි ආදායම** | | **15,330,000** |
| අඩු කළා -52 වගන්තිය යටතේ සුදුසුකම් ලත් ගෙවීම් සහ සහනඃ | සටහන 4 | (1,825,000) |
| **(a) බදු අය කළ හැකි ආදායම** | | **13,505,000** |
| **(b) ගෙවිය යුතු දළ ආදායම් බද්ද** | සටහන 5 | **4,411,800** |
| **අඩු කළාඃ බදු බැර** | | |
| අඩු කළ අත්තිකාරම් ආදායම් බද්ද | (2,250,000) | |
| වාරික ගෙවීම් | (900,000) | |
| ස්ථාවර තැන්පතු පොළිය මත රඳවා ගැනීමේ බද්ද | (40,000) | (3,190,000) |
| **(c) ගෙවිය යුතු ඉතිරි ආදායම් බද්ද** | | **1,221,800** |

**(c) බදු නිදහස් ආදායම**

| | |
|---|---|
| ලැයිස්තුගත පොදු සමාගම් වල කොටස් විකිණීමෙන් ලද ලාභය | 195,000 |
| ලාභාංශ ආදායම (ලැබුණු ලාභාංශ වලින් ගෙවන ලද) | 240,000 |

**සටහන 1 සේවා නියුක්ත ආදායම** (රු.)

| | | |
|---|---|---|
| දළ වැටුප | 560,000*12 | 6,720,000 |
| ගමන් ප්‍රතිලාභ | (20,000+20,000) *12 | 480,000 |
| රෝහල් ගාස්තුව (සමාගමේ සියලුම සේවකයින් හට සමාන කොන්දේසි මත වෛද්‍ය ප්‍රතිලාභ ලබාගත හැකිය) | 400,000*12.5%*12 | බද්දට යටත් නොවේ |
| විදේශ සංචාර වියදම් ප්‍රතිපූරණය - පුද්ගලික ගමනකි | | 960,000 |
| සේවායෝජකයා විසින් සපයන ලද වාසස්ථානය | (90,000 X 12) X50% | 540,000 |
| **සේවා නියුක්තියෙන් ලද තක්සේරු කළ හැකි ආදායම** | | **8,700,000** |

**සටහන 2 ව්‍යාපාර ආදායම** (රු.)

| | (+) | (-) |
|---|---|---|
| බදු පෙර ශුද්ධ ලාභය | 3,700,000 | |
| මුද්‍රණ සහ පිලිද්‍රව්‍ය | ඉඩ දෙනු ලැබේ | |
| කාර්යාල කුලිය | ඉඩ දෙනු ලැබේ | |
| විදුලිය සහ දුරකථන ගාස්තු | ඉඩ දෙනු ලැබේ | |

| | | |
|---|---|---|
| බැංකු ණය පොලිය :(පෞද්ගලිකව භාවිතා කරන ලද) | 230,000 | |
| | **3,930,000** | |
| **ව්‍යාපාරයෙන් ලද තක්සේරු කළ හැකි ආදායම** | | **3,930,000** |

**සටහන 3 ආයෝජන ආදායම** (රු.)

| | (+) | (-) |
|---|---|---|
| **<u>දළ පොලී ආදායම</u>** | | |
| භාණ්ඩාගාර බිල්පත් මත | 1,000,000 | |
| ස්ථාවර තැන්පතු මත | 800,000 | 1,800,000 |
| ලැයිස්තුගත පොදු සමාගම් වල කොටස් විකිණීමෙන් ලද ලාභය | බද්දෙන් නිදහස් | - |
| ලාභාංශ ආදායම (ලැබුණු ලාභාංශ වලින් ගෙවන ලද) | බද්දෙන් නිදහස් | - |
| **<u>කුලී ආදායම</u>** | | |
| දළ කුලී ආදායම (75,000 X 12) | 900,000 | |
| (-) ගෙවූ වරිපනම් (කුලී නිවැසියා විසින් ගෙවා ඇත) | ඉඩ දෙනු නොලැබේ | 900,000 |
| **ආයෝජනයෙන් ලද තක්සේරු කළ හැකි ආදායම** | | **2,700,000** |

**සටහන 4: 52 වගන්තිය යටතේ සුදුසුකම් ලත් ගෙවීම් සහ සහනඃ**

| | (රු.) |
|---|---|
| පුද්ගලික සහන | 1,200,000 |
| දළ කුලී ආදායමෙන් 25% ක දීමනාව (900,000 ඃ 25%) | 225,000 |
| ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයට සිදු කළ පොත් පරිත්‍යාගය | 400,000 |
| | **1,825,000** |

**සටහන 5: ගෙවිය යුතු දළ ආදායම් බද්ද**

| | (රු.) | | |
|---|---|---|---|
| පළමු | 500,000 | 6% | 30,000 |
| ඊළඟ | 500,000 | 12% | 60,000 |
| ඊළඟ | 500,000 | 18% | 90,000 |
| ඊළඟ | 500,000 | 24% | 120,000 |
| ඊළඟ | 500,000 | 30% | 150,000 |
| ඉතිරිය (13,505,000-2,500,000)X36% | | 36% | 3,961,800 |
| | | | **4,411,800** |

***(මුළු ලකුණු 25)***

***C කොටසෙහි අවසානය***

## *Notice:*

These answers compiled and issued by the Education and Training Division of AAT Sri Lanka constitute part and parcel of study material for AAT students.
These should be understood as Suggested Answers to question set at AAT Examinations and should not be construed as the "Only" answers, or, for that matter even as "Model Answers". The fundamental objective of this publication is to add completeness to its series of study texts, designs especially for the benefit of those students who are engaged in self-studies. These are intended to assist them with the exploration of the relevant subject matter and further enhance their understanding as well as stay relevant in the art of answering questions at examination level.

*© 2021 by the Association of Accounting Technicians of Sri Lanka (AAT Sri Lanka). All rights reserved. No part of this document may be reproduced or transmitted in any form or by any means, electronic, mechanical, photocopying, recording or otherwise without prior written permission of the Association of Accounting Technicians of Sri Lanka (AAT Sri Lanka)*